සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Received

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත්
Department of Education – Western Province Department of Education – Western
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත්
Department of Education – Western Province Department of Education – Western
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත්
Department of Education – Western Province Department of Education – Western

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Department of Education – Western Province**

පළමු වාර ඇගයීම
**First Year Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade } 9 | විෂයය Subject } බුද්ධ ධර්මය | පත්‍රය Paper } I , II | කාලය Time } පැය 02 |

නම :- ........................................................................ විභාග අංකය :- .......................................

## I - කොටස

**සැලකිය යුතුයි**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40 කි.
- පහත සඳහන් ඒ ඒ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

---

(01) බුදුරජාණන් වහන්සේ "බේලුව" ගමෙහි වැඩ සිටියේ,
1) පළමු වන වස්කාලයයි   2) දසවන වස්කාලයයි
3) විසිවන වස්කාලයයි   4) අවසන් වස්කාලයයි

(02) "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ රෝගීව සිටිනු දුටු මට බලවත් ශෝකයක් හටගැනිණි. මම සිහිය උපදවාගත නොහැකි තත්ත්වයකට පත්වීමි . . . . " යනාදී වශයෙන් ප්‍රකාශ කළේ.
1) ආනන්ද තෙරණුවෝ ය.   2) නන්ද තෙරණුවෝ ය.
3) සැරියුත් තෙරණුවෝ ය.   4) මුගලන් තෙරණුවෝ ය.

(03) බුදුරජාණන් වහන්සේට අවසන් දානය පූජා කළේ,
1) අනේපිඬු සිටුතුමා ය.   2) චුන්ද කර්මාර පුත්‍රයා ය.
3) සුජාතා සිටුදේවිය ය.   4) තපස්සු හා භල්ලුක වෙළඳුන් ය.

(04) බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි සැදැහැතියන් විසින් දැක සංවේග උපදවාගත යුතු ස්ථාන හතරකි. එම එක් ස්ථානයක් වනුයේ,
1) රජගහනුවර වේළුවනාරාමයයි.   2) විශාලා මහනුවර වාලුකාරාමයයි
3) බරණැස් නුවර ඉසිපතනාරාමයයි   4) සැවත්නුවර ජේතවනාරාමයයි

(05) "මල් සුවඳ ආදියෙන් මා පුදන්නෝ නිසි ලෙස මා පුදන්නෝ නොවෙති. ධර්මානුකූලව පිළිවෙත් පුරන්නෝම මා පුදන්නෝ වෙති. බුදුරජාණන් වහන්සේ මෙලෙස දේශනා කිරීමට හේතු පාදක වූයේ,
1) සුභද්ද හිමි ය.   2) ධම්මාරාම හිමි ය.   3) අනුරුද්ධ හිමි ය.   4) ආනන්ද හිමි ය.

(06) පිරිනිවන් පා වදාළ තථාගත ශ්‍රීදේහය ආදාහනය කරනු ලැබුයේ,
1) පිප්ඵලී ගුහාවෙහි ය.   2) සූකරඛත ලෙනෙහි ය.
3) ලුම්බිනි උයනෙහි ය.   4) මකුට බන්ධන නම් ස්ථානයෙහි ය.

(07) බුදුරජාණන් වහන්සේ තුළ පැවති යථාවාදී තථාකාරී හා යථාකාරී තථාවාදී ගුණය යනු,

1) විෂම පුද්ගලයින් දමනය කිරීමේ ගුණයයි 2) අටලෝ දහමින් කම්පා නොවීමේ ගුණයයි.

3) කියන දෙය කරන, කරන දේ කියන ගුණයයි 4) අන්‍යමතවලට ඇහුම් කන්දීමේ ගුණයයි.

(08) අටලෝ දහමට අයත් වනුයේ,

1) කුසල් හා අකුසල් ය 2) හිරි හා ඔත්තප්ප ය 3) සුඛ හා දුක්ඛ ය. 4) සුබ හා අසුබ ය.

(09) "බුද්ධ මාතා" යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලැබුයේ

1) මහාමායා දේවියයි 2) ප්‍රජාපතීගෝතමී දේවියයි 3) යසෝදරා දේවියයි 4) විශාඛා දේවියයි

(10) බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටියදී පැවිදිව රහත් වූ අවසාන ශ්‍රාවකයාණන් වහන්සේ වූයේ,

1) ඡන්න හිමි ය 2) කාළුදායි හිමි ය. 3) ධම්මාරාම හිමි ය 4) සුභද්ද හිමි ය.

(11) සම්බුදු සසුනෙහි අභිඥාලාභී භික්ෂුණීන් වහන්සේලා අතර අගතනතුර හිමි වූයේ,

1) යසෝදරා තෙරණියට ය. 2) ධම්මදින්නා තෙරණියට ය.

3) මහා ප්‍රජාපතී තෙරණියට ය. 4) උප්පලවණ්ණා තෙරණියට ය.

(12) බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කොට ඉදිකළ ශාරීරික චෛත්‍යය වනුයේ,

1) මිහින්තලේ සේල චෛත්‍යයයි 2) අනුරාධපුර ථූපාරාම චෛත්‍යයයි

3) අනුරාධපුර මිරිසවැටි චෛත්‍යයයි 4) අනුරාධපුර ජේතවන චෛත්‍යයයි

(13) මහා සංසරත්නය පිළිබඳ වර්ණනා කෙරෙන "සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා" යන පද්‍ය සඳහන් වන ග්‍රන්ථය වන්නේ,

1) බුදුගුණ අලංකාරයයි 2) ලෝවැඩ සඟරාවයි 3) ලෝකෝපකාරයයි 4) කාව්‍යශේඛරයයි

(14) ස්තූප තනා පූජෝපහාර දැක්විය යුතු "තූපාරහ" පුද්ගලයෝ සතර දෙනෙකු පිළිබඳව බුද්ධ දේශනාවෙහි හඳුන්වා දී ඇත. ඒ අතරට අයත් වනුයේ,

1) ආගමික ශාස්තෘවරුන්ය 2) භික්ෂූන් වහන්සේලා ය.

3) සක්විති රජවරු ය. 4) බ්‍රාහ්මණ පූජකවරුන් ය.

(15) "භවත්නි, මහණ ගොයුම්හු වූ කලී විශිෂ්ට රූපසම්පත් ඇත්තෝ ය. දැකුම් කටයුතුය ප්‍රසාද ජනකය ." යනාදී වශයෙන් බුදුරජාණන් වහන්සේගේ ආකර්ෂණීය රූප විලාසය පිළිබඳ වර්ණනා කළේ,

1) කොසොල් රජතුමා ය. 2) සර්වමිත්‍ර බමුණා ය.

3) සෝණ දණ්ඩ බමුණා ය. 4) භාරද්වාජ බමුණා ය.

(16) අපට එදිනෙදා මුහුණ පෑමට සිදුවන ගැටලු බොහොමයක් නිරාකරණය කර ගැනීම සඳහා වටිනා උපදෙස් ලබාදෙන බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වෙන දහම් ග්‍රන්ථය,

1) ධම්ම පදයයි 2) සිරිත් මල්දමයි 3) ලෝවැඩ සඟරාවයි 4) පූජාවලියයි

(17) සප්ත අපරිහානි ධර්ම පිළිපැදීම නිසා බුදුරජාණන් වන්සේගේ ප්‍රශංසාව පවා හිමිකරගත් එකල දඹදිව පැවැති රාජ්‍යයක් වූයේ

1) මගධ රාජ්‍යයයි. 2) කෝසල රාජ්‍යයයි. 3) වජ්ජි රාජ්‍යයයි. 4) අවන්ති රාජ්‍යයයි.

(18) සිතින් සිදුකෙරන අකුසල කර්මයකි,
1) මුසාවාදය 2) ව්‍යාපාදය 3) කාමමිථ්‍යාචාරය 4) අදත්තාදානය

(19) පාවා නුවර සිට කුසිනාරා නුවර බලා වඩිනා බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා, තෙරුවන් සරණ ගොස්, බුදුරජාණන් වහන්සේට සිනිඳු සළු යුවලක් පූජා කරන ලැබුයේ,
1) පුක්කුස රජතුමා ය. 2) කොසොල් රජතුමා ය. 3) උදය බමුණා ය. 4) සෝණ දණ්ඩ බමුණා ය.

(20) බුදුරජාණන් වහන්සේ නිසි ලෙස පුදන සැබෑ බෞද්ධ දරුවෙකු වශයෙන් ඔබ විසින් සිදු කළ යුතු වඩාත් උතුම්ම පූජාව වනුයේ,
1) නිතර බෝධිපූජා පැවැත්වීමයි.
2) සුවඳ මල්මාලා, කොඩිවැල් පූජා කිරීමයි
3) දේව පූජා සහ දෙවියන්ට පිං අනුමෝදන් කිරීමයි
4) ධර්මානුකූල ප්‍රතිපත්තීන්ට අනුව කටයුතු කිරීමයි.

(ල. 2 x 20 = 40)

## II - කොටස

**සැලකිය යුතුයි**

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුලත්ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙකුත් ප්‍රශ්න හතරට ලකුණු 10 බැගින් ද හිමිවෙයි.

(01) පාසල් පාදක තක්සේරුකරණයට අදාළව ඔබ පන්ති කාමරයේ දී සකස් කරන ලද දහම් සඟරාව ඇසුරු කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
i) දහම් සඟරාව සැකසීම සඳහා ඔබ උපයෝගී කරගත් පෙළපොතෙහි ඇතුළත් පාඩම කුමක්ද?
ii) ඔබ කණ්ඩායම සකස් කළ දහම් සඟරාවට යෙදූ නම කුමක්ද?
iii) බෞද්ධ රජදරුවන්ගේ අනුග්‍රහය ඇතිව ශ්‍රී ලංකාව තුළ විවිධ පූජනීය ස්ථාන බිහිවීම ආරම්භ වූයේ කවර ඓතිහාසික සිදුවීමකින් පසුවද?
iv) උතුරු මැද පළාත තුළ පිහිටි සොළාස්මස්ථානයට අයත් පූජනීය ස්ථාන 4 ක් නම් කරන්න.
v) අනුරාධපුර පුද බිමෙහි පිහිටා ඇති සොළොස්මස්ථානයට අයත් නොවන අටමස්ථානයට අයත් පූජනීය ස්ථාන දෙක මොනවාද?
vi) පැරැන්නෝ වන්දනා ගමන් යාමේදී සාමූහිකව, නඩ වශයෙන් යාම අනුගමනය කළ සිරිතයි. එහි ප්‍රධානියා හැඳින්වූයේ කුමන නමකින්ද?
vii) අපගේ මුතුන් මිත්තන් ආදර්ශයට ගනිමින් වන්දනා ගමන් යාමේදී අනුගමනය කළ යුතු සිරිත් විරිත් 4 ක් ලියන්න.
viii) බුදුරජාණන් වහන්සේගේ වම් දළදා වහන්සේ හා ඌර්ණ රෝම ධාතූන් වහන්සේ නිධන් කොට ඇති චෛත්‍ය දෙක පිළිවෙලින් ලියන්න.
ix) ශ්‍රී ලාංකික බැතිමතුන් ශ්‍රී පාද වන්දනාවෙහි යෙදෙන්නේ වසරෙහි කුමන මාස වලදී ද?
x) ඔබ පන්ති කාමරයේදී කණ්ඩායමක් ලෙස එකතු වී කටයුතු කිරීමෙන් ඔබ තුළ ගොඩ නැගෙන සමාජ ගුණධර්ම 4 ක් ලියන්න.

(ලකුණු 2 X 10 = 20)

(02) බුද්ධ චරිතය, පරමාදර්ශී වූ නායකත්ව ලක්ෂණ රැසකින් සමන්විතය.

1) නායකයෙකු තුළ නොතිබිය යුතු අගතිගාමී ලක්ෂණ 4 (සතර අගති) මොනවාද? (ල. 2)
2) බුද්ධ චරිතයේ දක්නට ලැබෙන නායකත්ව ගුණාංග 3 ක් ලියන්න. (ල. 3)
3) බුදු සිරිතෙහි නායකත්ව ලක්ෂණ ඇසුරු කරගනිමින් ඔබ පාසලෙහි ප්‍රදර්ශනය කිරීමට සුදුසු ආදර්ශ පාඨ 5 ක් ලියන්න. (ල. 5)

(03) ලෝකවාසී ජනතාවට අනුත්තර වූ පින්කෙත සංඝ රත්නයයි.

1) සම්බුද්ධ ශාසනය තුල සංඝරත්නය ආරම්භ වන පොහොය හා ආරම්භක පිරිස නම් කරන්න. (ල. 2)
2) සංඝරත්නය සතු සුවිශේෂී ගුණ නමය අතුරින් 3 ක් ලියන්න. (ල. 3)
3) ගමෙහි විහාරස්ථානයෙහි වැඩ සිටින සංඝරත්නය වෙනුවෙන් ගිහියකු වශයෙන් ඔබ විසින් ඉටු කළ යුතු යුතුකම් 5 ක් පෙන්වා දෙන්න. (ල. 5)

(04) බුදුරජාණන් වහන්සේ පසු ගමන් කරමින් උපහාර දැක්වූ එකම රහත් තෙරණිය මෙන්ම කාන්තාවද වූයේ මහා ප්‍රජාපතී තෙරණියයි.

1) බුදුරජාණන් වහන්සේ විසින් කාන්තා පැවිද්ද ලබාදීම සඳහා පිළිගත යුතුයයි ඉදිරිපත් කළ කරුණු හැඳින්වෙන්නේ කුමන නමකින්ද? (ල. 2)
3) මහා ප්‍රජාපතී තෙරණිය බුදු සසුනෙහි ලැබූ අග තනතුර, භික්ෂුණී ශාසනය ආරම්භ කළ ස්ථානය හා ඒ සඳහා පුරෝගාමීව කටයුතු කළ තෙරුන් වහන්සේ නම් කරන්න. (ල. 3)
3) ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 5 ක් පෙන්වා දෙන්න. (ල. 5)

(05) කුසල් සිත් වැඩෙන මානසික ව්‍යායාමය භාවනාවයි.

1) කුඩා සිදුහත් කුමරු දඹරුක් සෙවනෙහි සිදු කළ භාවනාව කුමක් ද? (ල. 2)
2) භාවනා කිරීමට යොමුවීමේදී පෙර සුදානමක් ලෙස සිදුකළ යුතු කාර්යන් 3 ක් ලියන්න (ල. 3)
3) භාවනා කිරීමෙන් පාසල් ශිෂ්‍යයෙකුට ලබාගත හැකි ප්‍රයෝජන 5 ක් පෙන්වා දෙන්න. (ල. 5)

(06) තුන්ලොවක් සනසා වදාළ ඒ අසහාය ශාස්තෘවරයාණන් වහන්සේ වෙසක් පුර පසළොස්වක පොහොය දිනයකදී පිරිනිවන් පා වදාළහ.

1) බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පා වදාළේ කවර ස්ථානයක දී ද (ල. 2)
3) බුදුරජාණන් වහන්සේගේ අවසාන අවවාදය වූයේ කුමක්ද? (ල. 3)
3) සම්බුද්ධ ආදාහන පූජෝත්සවය පිළිබඳව වගන්ති 5 ක් ලියන්න. (ල. 5)

(07) පුද්ගල දියුණුවට හේතුවන කරුණු පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ මහා මංගල සූත්‍රය දේශනා කළහ.

1) බුදුරජාණන් වහන්සේ මහා මංගල සූත්‍ර දේශනාව සිදුකළේ කවුරුන් උදෙසාද? (ල. 2)
2) තුන් සූත්‍රයට අයත් පිරිත් දේශනා 3 නම් කරන්න. (ල. 3)
3) මහා මංගල සූත්‍රයේ සඳහන් වන පරිදි ශිෂ්‍ය ජීවිතයට වඩාත් වැදගත් වන මංගල කරුණු 5 ක් ලියන්න. (ල. 5)